**මධ්‍යම අංශය**

**රාජකීය විද්‍යාලය - කොළඹ 07**

**දෙවන වාර පරීක්ෂණය - 2010**

**6 ශ්‍රේණිය** **කාලය ඃ පැය 2 යි**

# බුද්ධ ධර්මය

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.

(01) නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. නව අරහාදි බුදුගුණ වර්ණනා කර ඇති කවි පොතකි,
    i. බුදුගුණාලංකාරය ii. ලෝවැඩ සඟරාව
    iii. සිරිත් මල්දම iv. සුභාෂිතය

02. බෞද්ධයාගේ අත් පොත වූ ධම්ම පදයෙහි ඇතුළත් ගාථා සංඛ්‍යාව,
    i. 402 ii. 413 iii. 423 iv. 433

03. සිදුහත් කුමරු ගිහිගෙයින් නික්මී චන්න ආමාත්‍ය සහ කන්ථක අසු සමගින් පැමිණියේ කුමන ගංතෙරටද?
    i. නේරංජනා ii. ගංගා නම් ගඟ
    iii. අනෝමා iv. වේරංජනා

04. බුදුරජාණන් වහන්සේ "අනන්ත ලක්ඛණ සූත්‍රය" දේශනා කළේ,
    i. අනේ පිඬු සිටුතුමාට ii. පස්වග මහණුන්ටය
    iii. යසකුල පුත්‍රයාටය iv. සුද්ධෝදන රජතුමාට

05. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යනු,
    i. ත්‍රි ශික්ෂාවයි ii. ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවයි
    iii. ත්‍රිවිද්‍යාවයි iv. ත්‍රිලක්ෂණයයි

06. මහාමායා දේවියගේ මව්පියන් විසුවේ කොහේද?

i. කොසඹෑනුවර  ii. කිඹුල්වත් පුර

iii. විශාලා නුවර  iv. දෙව්දහ නුවර

07. රාහුල කුමාරයා පැවිදි කිරීමට භාර වූයේ කාටද?

i. සැරියුත් තෙරුන්ට  ii. මුගලන් තෙරුන්ට

iii. උපාලි තෙරුන්ට  iv. ආනන්ද තෙරුන්ට

08. වේළුවනාරාමයේ වැඩ වාසය කරන බුදුරජාණන් වහන්සේට බැණ වැදුනේ කුමන බමුණාටද?

i. සටීකාර බමුණාට  ii. සර්වමිත්‍ර බමුණාට

iii. අක්කෝස බමුණාට  iv. අක්කෝස බමුණාට

09. "අත්තූපනායික ධර්මය" යනු,

i. අනුන් උපමා කරගෙන වරදින් මිදීම.

ii. තමා උපමා කොට වරදින් මිදීම.

iii. තමා උපමා කර නොගැනීම.

iv. අනුන් උපමා කර නොගැනීම.

10. "සිඟාලෝවාද සූත්‍රයේ " සඳහන් පරිදි දරුවන්ගෙන් දෙමාපියන්ට ඉටුවිය යුතු යුතුකම් ගණන,

i. දෙකකි  ii. තුනකි  iii. හතරකි  iv. පහකි

11. "සබ්බේ භායන්ති මච්චුනෝ" යන ගාථා පාඨයේ තේරුම වන්නේ,

i. සියල්ලෝම මරණයට බිය වෙති.

ii. සියල්ලෝම මරණයට ප්‍රිය වෙති.

iii. සියල්ලෝම හිංසනයට බිය වෙති.

iv. සියල්ලෝම දඬුවමට බිය වෙති.

12. පොහොය දිනයට සමාදන් වන ශීලය උදේ 6.00 සිට සවස 6.00 දක්වා,

i. පන්සිල් ii. දසසිල්

iii. ත්‍රිකෝටික පාරිශුද්ධ ශීලය iv. අටසිල්

13. පුද්ගලයකුට යමක් පරිත්‍යාග කරන්නකුගේ සිතේ ඇති වන්නේ,

i. අමෝහ සිතුවිලි ii. අලෝභ සිතුවිලි

iii. ද්වේශ සිතුවිලි iv. අදෝස සිතුවිලි

14. බුදුරජාණන් වහන්සේ දියුණු වීමට හේතු විමසූ විට, දේශනා කළ ජාතක කතාව වන්නේ,

i. සුතසෝම ජාතකය ii. මාතු පෝෂක ජාතකය

iii. අත්ථස්සද්වාර ජාතකය iv. වෙසන්තර ජාතකය

15. බුදුරජාණන් වහන්සේට ගිලන්පස පූජා කරන ගාථා පාඨය,

i. ගණසාරප්ප දිත්තේන

ii. අධිවාසේතු නො භන්තේ ගිලාන පච්චයං ඉමං

iii. සුගන්ධිකාය වදනං

iv. සබ්බ පාපස්ස අකරණං

16. විහාරස්ථානයේ අපි වැඳුම් පිදුම් කරන "ශාරීරික චෛත්‍යය" යි කියනු ලබන්නේ,

i. වෙහෙර වහන්සේට ii. පිළිම වහන්සේට

iii. බෝධීන් වහන්සේට iv. බුදුගෙයට

17. අපි බුදුරජාණන් වහන්සේට වඳින්නේ උන්වහන්සේ සතු,

i. අවංක භාවයට

ii. කරුණාවට

iii. නායකත්වයට

iv. උත්තරීතර ගුණ සමුදායට ගරු කිරීමට

18. බුදුරජාණන් වහන්සේ කාලයෙන් උපරීම ප්‍රයෝජන ගැනීම පිණිස දිනය බෙදූ දින චරියාවේ කොටස් ගණන,

i. 6 කි ii. 3 කි iii. 5 කි iv. 4 කි

19. චතුරාර්‍ය සත්‍යය තමාගේ නුවණින් අවබෝධ කොට ගෙන කරුණාවෙන් ප්‍රකාශ කළ බැවින්,

i. සම්මා සම්බුද්ධ නම් වීය ii. භගවා නම් වීය

iii. පුරිස ධම්ම සාරථී නම් විය iv. ලෝක විදූ නම් වීය

20. සියලු කෙලෙසුන් නැසීමේ නුවණ,

i. චුතුපපාතඥාණය ii. ආසවක්ඛය ඥාණය

iii. පුබ්බේ නිවාසානුස්සති ඥාණය iv. ඍද්ධි ඥාණය

(ලකුණු 2 x 20)

(02) පළමු වන ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු වන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

01. ධම්ම පදය බුදුරජාණන් වහන්සේ නොයෙක් අවස්ථා වලදී දේශනා කර ඇත්තේය. ඒ හැම ගාථාවකින්ම පුද්ගලයකුගේ ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය උපදෙසක් ඉගැන්වේ. මෙහි දක්වෙන්නේ එම ගාථා අතුරෙන් එකකි.

A. මෙම ගාථාව සම්පූර්ණ කරන්න.

නහී වේරේන වේරානි

......................................................

......................................................

......................................................

B. මෙම ගාථාවේ තේරුම ලියන්න.

.............................................................................

.............................................................................

C. මෙම ගාථාවෙන් කියවෙන අකුසලය සිදුවන්නේ තුන්දොරේ කුමන කොටසින්ද?

..................................................................................................................

D. වරද පිළිගැනීමේ අගය පෙන්වා කෝප සහගත සිතුවිලි සිතේ ලබා නොගැනීමෙන් තමන් හට සැලසෙන වාසි 2 කක් ලියන්න.

i. ...........................................................................................

ii. ........................................................................................... (ලකුණු 16)

02. A. අපි ඉගන ගත් භාවනා වර්ග 3 ක් නම් කරන්න.

i. ...........................................................................................

ii. ...........................................................................................

iii. ...........................................................................................

B. භාවනා කිරීමෙන් ශිෂ්‍යකුට ලැබිය හැකි ප්‍රතිඵල බොහෝය ඉන් 3 ක් ලියන්න.

i. ...........................................................................................

ii. ...........................................................................................

iii. ........................................................................................... (ලකුණු 12)

03. A. සිංහල ජාතක කතාපොත ලියවුණේ කුමන යුගයේද?

..........................................................................

B. ඔබ නිතර කරන සාධු චර්යා 2 ක් ලියන්න.

i. ...........................................................................................

ii. ...........................................................................................

C. ස්වර්ණ හංස ජාතකයෙන් ගත හැකි ආදර්ශයක් ලියන්න.

..................................................................................... (ලකුණු 08)

04. A. ප්‍රිය වදන් වලට කැමති බව සහ අමිහිරි වදන් වලට අකමැති බව පෙන්නුම් කරන ජාතකය කුමක්ද?

.................................................................................

B. පරිසරය පරිසිදුව තබා ගෙන වෘක්ෂලතා සතා සිවුපා රැකගත් ලොව මුල්ම පරිසර වේදියාණෝ කවුරුන්ද?

.................................................................................

C. අප ජීවත් වන සමාජය විනාශ වීමට තුඩු දෙන කරුණු 3 ක් ලියන්න.

i. ..............................................................................................

ii. ..............................................................................................

iii. ..............................................................................................

D. රාහුල හාමුදුරුවන් සතු ගුණ රැසක් තිබු නිසා අගතැන් ලැබීය. කුමන භික්ෂූන් අතරින් අගතැන් ලැබීද?

.............................................................................................. (ලකුණු 12)

05. A. අපේ ගමේ විහාරස්ථානය බෞද්ධයන් විසින් රැක ගත යුතු ස්ථානයකි. රැක ගැනීම උදෙසා අප පන්සලට ගිය විට කළ හැකි සේවා 3 ක් ලියන්න.

i. ..............................................................................................

ii. ..............................................................................................

iii. ..............................................................................................

B. මෙම පසළොස්වක පොහොය දිනයන් එළඹෙන මාස මොනවාද?

i. පොසොන් - ..............................................................

ii. වෙසක් - ..............................................................

iii. ඇසළ - .............................................................. (ලකුණු 12)

06. A. සත්සතිය නම් කරන්න..

i. ..............................................................................................

ii. ..............................................................................................

iii. ..............................................................................................

iv. ..............................................................................................

v. ..............................................................................................

vi. ..............................................................................................

vii. ..............................................................................................

(ලකුණු 12)